සියලු ම හිමිකම් ඇවිරිණි.

# ශ්‍රී ලංකා ගණකාධිකරණ ශිල්පීය ආයතනය

## අදියර II විභාගය - 2021 ජනවාරි

## (201) උසස් මූල්‍ය ගිණුම්කරණය සහ පිරිවැයකරණය

(Advanced Financial Accounting & Costing)

2021-03-20
පෙරවරු
[8.45 – 12.00]

පිටු ගණන : 11
ප්‍රශ්න ගණන: 07

- **අයදුම්කරුවන්ට උපදෙස්** (අවධානයෙන් කියවිය යුතුය):

(1) ***දී ඇති කාලය :*** *කියවීම සඳහා - විනාඩි 15 යි.*
*උත්තර ලිවීම සඳහා - පැය 03 යි.*

(2) ***සියලුම ප්‍රශ්නවලට උත්තර සැපයිය යුතු වේ.***

(3) *ඉල්ලුම් කරන ලද* ***මාධ්‍යයෙන්, එක් භාෂාවකින් පමණක්,*** *ඔබ වෙත සපයන ලද* ***පොත්වල උත්තර*** *ලියන්න.*

(4) *ගණනය කිරීම් සහ පෙරවැඩ අමුණන්න. උපකල්පන කිසිවක් ඇතොත්, ඒවා පැහැදිලිව දක්වන්න.*

(5) *වැඩසටහන් ගතකිරීම කළ නොහැකි ගණක යන්ත්‍ර* ***පමණක්*** *භාවිත කිරීමට ඉඩ දෙනු ලැබේ.*

(6) *අර්ථකථන සහිත* ***කළ යුතු ක්‍රියා පරීක්ෂා ලැයිස්තුව*** *අමුණා ඇත. වාස්තවික පරීක්ෂණ ප්‍රශ්න හැර අන් සෑම ප්‍රශ්නයක්ම කළ යුතු ක්‍රියාවකින් යුක්ත වේ. කළ යුතු ක්‍රියා පරීක්ෂා ලැයිස්තුවේ එම ක්‍රියාව සඳහා දී ඇති අර්ථකථනය පදනම් කරගෙන අයදුම්කරුවන් විසින් ප්‍රශ්නය සඳහා අවශ්‍ය උත්තර සැපයිය යුතුය.*

(7) *ලකුණු 100 යි.*

---

## A කොටස

### වාස්තවික පරීක්ෂණ ප්‍රශ්න (OTQs)

(මුළු ලකුණු 25)

## 01 වන ප්‍රශ්නය

*අංක 1.1 සිට 1.5 දක්වා ඇති ප්‍රශ්න සඳහා වඩාත්ම නිවැරදි උත්තරය තෝරන්න. තෝරාගත් උත්තරයට අදාළ අංකය ප්‍රශ්න අංකය සමග ඔබේ උත්තර පොතේ ලියන්න.*

1.1 මූල්‍ය ප්‍රකාශනයන්හි සංරචකයන් (components) දෙකක්(02) වන්නේ:

(1) වත්කම් සහ ස්කන්ධය (හිමිකම).

(2) ආදායම් සහ වියදම්.

(3) මූල්‍ය තත්ත්ව ප්‍රකාශනය සහ විස්තීර්ණ ආදායම් ප්‍රකාශනය.

(4) ශේෂ පිරික්සුම සහ මුදල් පොත.

(ලකුණු 02)

1.2 පහත සඳහන් ශේෂයන් **සීමාසහිත සෙනාරා (පෞද්ගලික) සමාගමේ** වාර්තාවලින් 2019 අප්‍රේල් 01 දිනට උපුටා ගන්නා ලදි:

*(රු.'000)*

| | **හර** | **බැර** |
|---|---|---|
| මෝටර් වාහන, පිරිවැයට | 5,000 | |
| 2019 අප්‍රේල් 01 දිනට සමුච්චිත ක්ෂය | | 1,500 |

2020 මාර්තු 31 දින, සමාගම විසින් මෙම මෝටර් රථය රු.3,200,000/- ට විකුණන ලදි. මෙම මෝටර් රථයේ ප්‍රයෝජනවත් ආයු කාලය අවුරුදු 10 කි.

මෝටර් රථය විකිණීමේ ලාභය / අලාභය වන්නේ:

(1) රු.200,000/- (ලාභයකි). (2) රු.200,000/- (අලාභයකි).

(3) රු.300,000/- (ලාභයකි). (4) රු.300,000/- (අලාභයකි). (ලකුණු 02)

1.3 සීමිත පෞද්ගලික සමාගමක් සම්බන්ධයෙන් පහත සඳහන් ප්‍රකාශ සලකා බලන්න:

**(a)** සමාගමකට තම කොටස් ප්‍රසිද්ධයේ නිකුත් කළ හැකිය.

**(b)** සමාගමක් එක් කොටස්කරුවෙකු සමඟ සංස්ථාපනය කළ හැකිය.

**(c)** සමාගමක සිටිය හැකි උපරිම කොටස්කරුවන් ගණන සඳහා සීමාවක් නොමැත.

ඉහත සඳහන් ඒවා අතුරෙන්, නිවැරදි ප්‍රකාශය / ප්‍රකාශයන් වන්නේ:

(1) **(a)** පමණි. (2) **(b)** පමණි.

(3) **(a)** සහ **(c)** පමණි. (4) ඉහත සඳහන් සියල්ලම. (ලකුණු 02)

1.4 **A ද්‍රව්‍යය** සම්බන්ධයෙන් පහත සඳහන් තොරතුරු උපුටාගෙන ඇත:

| | |
|---|---|
| උපරිම පරිභෝජනය | මාසයකට ඒකක 400 බැගින් |
| අවම පරිභෝජනය | මාසයකට ඒකක 150 බැගින් |
| පොරොත්තු කාලය | මාස 2 - 4 |
| යළි ඇණවුම් ප්‍රමාණය | ඒකක 700 |

**A ද්‍රව්‍යය** සඳහා යළි ඇණවුම් මට්ටම [Re-Order Level (ROL)] වන්නේ:

(1) ඒකක 1,600 කි. (2) ඒකක 1,000 කි. (3) ඒකක 800 කි. (4) ඒකක 1,500 කි.

(ලකුණු 02)

1.5 සංකලිත ගිණුම්කරණ ක්‍රමයකදී (integrated accounting system) අමුද්‍රව්‍ය ණය පදනම මත මිලට ගැනීම, වාර්තා කිරීමේ නිවැරදි ද්විත්ව සටහන වන්නේ:

| | **හර** | **බැර** |
|---|---|---|
| (1) | ණයහිමි පාලන ගිණුම. | ද්‍රව්‍ය පාලන ගිණුම. |
| (2) | ද්‍රව්‍ය පාලන ගිණුම. | ණයහිමි පාලන ගිණුම. |
| (3) | නොනිමි වැඩ පාලන ගිණුම. | ද්‍රව්‍ය පාලන ගිණුම. |
| (4) | ද්‍රව්‍ය පාලන ගිණුම. | නොනිමි වැඩ පාලන ගිණුම. |

(ලකුණු 02)

*අංක **1.6** සිට **1.10** දක්වා ඇති ප්‍රශ්නවලට උත්තර, ප්‍රශ්න අංක ද සමඟ ඔබේ උත්තර පොතේ ලියන්න.*

**1.6** 1890 හවුල් ව්‍යාපාර ආඥා පනතේ 24 වන වගන්තියේ සඳහන් ප්‍රතිපාදන දෙකක්(02) සඳහන් කරන්න. (ලකුණු 02)

**1.7** 1890 හවුල් ව්‍යාපාර ආඥා පනත අනුව හවුල්කරුවෙකුගේ අයිතිවාසිකම් තුනක්(03) සඳහන් කරන්න. (ලකුණු 03)

**1.8** මූල්‍ය ගිණුම්කරණය සහ පිරිවැය ගිණුම්කරණය අතර වෙනස්කම් තුනක්(03) සඳහන් කරන්න. (ලකුණු 03)

**1.9** **සීමාසහිත ABC (පෞද්ගලික) සමාගමේ** 2020 මාර්තු 31 දිනෙන් අවසන් මාසයට අදාල වාර්තාවලින් පහත සඳහන් තොරතුරු උපුටාගෙන තිබේ:

| | **රු.'000** |
|---|---:|
| විකුණුම් මත අය කළ එකතු කළ අගය මත බදු (VAT) | 9,000 |
| මිලට ගැනුම් මත එකතු කළ අගය මත බදු | 5,500 |
| විකුණුම් ආපසු එවුම් මත එකතු කළ අගය මත බදු | 550 |

2020 මාර්තු 01 දිනට එකතු කළ අගය මත බදු පාලන ගිණුමේ බැර ශේෂය රු.4,500,000/- කි.

එකතු කළ අගය මත බදු පාලන ගිණුම පිළියෙල කරන්න. (ලකුණු 03)

**1.10** **සුමුදු, සීමාසහිත සිල්කි වෙයා සමාගමේ** සේවයේ නියුතු අතර, ඇයගේ දෛනික නිෂ්පාදන නිමැවුම් ඒකක ගණන මත පදනම්ව ඇයට සතිපතා ගෙවීම් කරනු ලබයි. වැඩ කරන දින 5 කින් සමන්විත පසුගිය සතිය තුළ ඇයගේ දෛනික නිමැවුම් ඒකක ගණන පහත සඳහන් පරිදි විය:

| **දිනය** | **කැලි ගණන** |
|---|---|
| 1 | 7 |
| 2 | 8 |
| 3 | 9 |
| 4 | 7 |
| 5 | 11 |

පහත සඳහන් අතිරේක තොරතුරු ද සපයා ඇත:

(1) දිනකට නිෂ්පාදනය කරන කැලි 10 ක් දක්වා ඒකකයකට රු.150/- බැගින් ගෙවනු ලැබේ. දෛනිකව **සුමුදුට** ගෙවිය යුතු සහතික කළ අවම මුදල රු.1,200/- කි.

(2) දිනකට කැලි 10 ක් ඉක්මවන ඕනෑම අතිරික්ත නිෂ්පාදන සඳහා ඒකකයකට 20% ක අමතර දිරි දීමනාවක් ගෙවනු ලැබේ.

ඉහත සඳහන් සතිය සඳහා **සුමුදුගේ** මුළු වැටුප ගණනය කරන්න. (ලකුණු 04)

(මුළු ලකුණු 25)

*A කොටසෙහි අවසානය*

<u>B කොටස</u>

(මුළු ලකුණු 50)

## 02 වන ප්‍රශ්නය

**අනුහස්, දෙව්මි** සහ **ලිහිණි** යනු ලාභ'ලාභ පිළිවෙලින් 5:3:2 අනුපාතයට බෙදාගනිමින් **ADL හවුල්කරුවෝ** නම් හවුල් ව්‍යාපාරයේ හවුල්කරුවන්ය.

(1) හවුල් ගිවිසුමෙහි පහත සඳහන් දෑ අන්තර්ගත වේ:

- ප්‍රාග්ධන ගිණුම්වල ආරම්භක ශේෂයන් මත වාර්ෂිකව 10% බැගින් වූ ප්‍රාග්ධන පොලියක් ගෙවනු ලැබේ.
- **දෙව්මි** ට මාසිකව රු.50,000/- ක වැටුපක් ලැබීමට හිමිකමක් ඇත.

(2) පහත ශේෂයන් 2020 දෙසැම්බර් 31 දිනට හවුල් ව්‍යාපාරයේ ශේෂ පිරික්සුමෙන් උපුටා ගන්නා ලදී:

| | **හර (රු.'000)** | **බැර (රු.'000)** |
|---|---|---|
| 2020 ජනවාරි 01 දිනට ප්‍රාග්ධන ගිණුම: | | |
| **අනුහස්** | | 6,000 |
| **දෙව්මි** | | 4,500 |
| **ලිහිණි** | | 3,000 |
| 2020 ජනවාරි 01 දිනට ජංගම ගිණුම: | | |
| **අනුහස්** | | 1,200 |
| **දෙව්මි** | 900 | |
| **ලිහිණි** | | 600 |
| ගැනිලි: | | |
| **අනුහස්** | 1,400 | |
| **දෙව්මි** | 800 | |
| **ලිහිණි** | 400 | |

(3) 2020 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා හවුල් ව්‍යාපාරයේ ශුද්ධ ලාභය රු.4,500,000/- ක් විය.

(4) 2020 දෙසැම්බර් 31 දින, සිය පවුලේ අවශ්‍යතාවයක් හේතුවෙන් **ලිහිණි** හවුල් ව්‍යාපාරයෙන් විශ්‍රාම ගැනීමට තීරණය කරන ලද අතර, ලාභ'ලාභ පිළිවෙලින් 3:2 අනුපාතයට බෙදාගනිමින් **අනුහස්** සහ **දෙව්මි** හවුල් ව්‍යාපාරය අඛණ්ඩව පවත්වාගෙන යාමට තීරණය කරන ලදී.

(5) 2020 දෙසැම්බර් 31 දිනට හවුල් ව්‍යාපාරයේ කීර්තිනාමය රු.1,500,000/- කට අගය කරන ලද අතර, එය කීර්තිනාම ගිණුමක් විවෘත නොකර හවුල්කරුවන්ගේ ප්‍රාග්ධන ගිණුම් තුළින් ගැලපීමට තීරණය කරන ලදී.

(6) 2020 දෙසැම්බර් 31 දිනට හවුල් ව්‍යාපාරයේ ජංගම නොවන වත්කම් පහත සඳහන් පරිදි ප්‍රත්‍යාගණනය කරන ලදී:

*(රු.'000)*

| | **2020 දෙසැම්බර් 31 දිනට ප්‍රත්‍යාගණිත අගය** | **පිරිවැය** | **2020 දෙසැම්බර් 31 දිනට සමුච්චිත ක්ෂය** |
|---|---|---|---|
| ඉඩම සහ ගොඩනැගිලි | 6,000 | 8,000 | 2,500 |
| මෝටර් වාහන | 3,000 | 4,000 | 1,400 |

ජංගම නොවන වත්කම් ප්‍රත්‍යාගණිත අගය මත හවුල් ව්‍යාපාරයේ ගිණුම්වල පවත්වාගෙන යාමට තීරණය කරන ලදී.

(7) **ලිහිණිගේ** විශ්‍රාම ගැනීමෙන් පසු ඇයට ගෙවිය යුතු මුදල ණය ගිණුමකට මාරු කිරීමට තීරණය කරන ලදී.

**ඔබ විසින් කළ යුතු දෑ:**

2020 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා පහත සඳහන් දෑ **පිළියෙල කරන්න**:

(a) හවුල්කරුවන්ගේ ජංගම ගිණුම. (ලකුණු 04)

(b) හවුල්කරුවන්ගේ ප්‍රාග්ධන ගිණුම. (ලකුණු 06)

(මුළු ලකුණු 10)

## 03 වන ප්‍රශ්නය

**වෙනුරට** අයත් ගෘහ භාණ්ඩ අලෙවි සැලක් වන **වෙනුර ට්‍රේඩර්ස්** හි පොත්වලින් පහත සඳහන් තොරතුරු උපුටා ගන්නා ලදී:

(1) වත්කම් සහ වගකීම් පහත පරිදි වේ:

*(රු.'000)*

| | **2019 අප්‍රේල් 01 දිනට** | **2020 මාර්තු 31 දිනට** |
|---|---|---|
| ඉඩම සහ ගොඩනැගිල්ල - ධාරණ අගයට | 7,300 | 6,500 |
| මෝටර් වාහන - ධාරණ අගයට | 5,000 | 6,400 |
| තොගය | 1,700 | 1,300 |
| වෙළෙඳ ලැබිය යුතු මුදල් | 1,800 | 1,400 |
| බැංකු ශේෂය | 1,500 | ? |
| වෙළෙඳ ගෙවිය යුතු මුදල් | 1,200 | 1,450 |
| උපචිත විදුලිය | 340 | 570 |

(2) **වෙනුර ට්‍රේඩර්ස්** විසින් නිසි පරිදි ගිණුම් පොත් පවත්වා නොගනී. 2019 අප්‍රේල් 01 දින සිට 2020 මාර්තු 31 දක්වා ඔහුගේ බැංකු ප්‍රකාශනවලින් පහත සඳහන් සාරාංශගත තොරතුරු උපුටාගන්නා ලදී:

*(රු.'000)*

| | |
|---|---|
| **බැංකුවේ තැන්පත් කරන ලද මුදල්:** | |
| අත්පිට මුදලට විකුණුම් | 4,200 |
| වෙළෙඳ ණයගැතියන්ගෙන් ලැබීම් | 3,100 |
| **චෙක්පත් මගින් සිදුකළ ගෙවීම්:** | |
| අත්පිට මුදලට ගැනුම් | 1,320 |
| වෙළෙඳ ණයහිමියන්ට කළ ගෙවීම් | 1,410 |
| මෝටර් වාහනයක් මිලට ගැනීම | 1,800 |
| විදුලිය | 580 |
| වැටුප් සහ වේතන | 1,200 |
| ලිපිද්‍රව්‍ය | 250 |

(3) **වෙනුර** විසින් ව්‍යාපාරයට ලැබුනු මුදල්වලින්, ඔහුගේ පෞද්ගලික ප්‍රයෝජනය සඳහා සෑම මසකම රු.40,000/- බැගින් ගැනිලි ලෙස ගත් මුදල හැර, අනෙකුත් සියලුම මුදල් ලැබීම් බැංකුගත කරන ලදී.

**ඔබ විසින් කළ යුතු දෑ:**

**වෙනුර ට්‍රේඩර්ස්** හි 2020 මාර්තු 31 දිනට ශේෂ පිරික්සුම **පිළියෙල කරන්න.** (ලකුණු 10)

## **04** වන ප්‍රශ්නය

**ෆියුචර් ස්ටාර්ස් ක්‍රීඩා සමාජය** එහි මෙහෙයුම් කටයුතු 2015 වර්ෂයේදී ආරම්භ කරන ලදී.

2020 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා ක්‍රීඩා සමාජයේ පහත තොරතුරු ඔබ වෙත සපයා ඇත:

(1) 2020 ජනවාරි 01 දිනට ක්‍රීඩා සමාජයේ සාමාජික සංඛ්‍යාව 350 ක් වූ අතර, සාමාජිකයෙකුගේ සාමාජික දායක මුදල වර්ෂයකට රු.2,000/- කි.

(2) සාමාජික ගාස්තු සම්බන්ධයෙන් පහත සඳහන් තොරතුරු ඉදිරිපත් කර ඇත:

- (i) සාමාජිකයන් දෙදෙනෙකු (02) විසින් 2020 වර්ෂයට ඔවුන්ගේ අදාල සාමාජික මුදල් 2019 වර්ෂය තුළදී ගෙවන ලදී.
- (ii) සාමාජිකයන් 10 දෙනෙකු 2019 වර්ෂයට අදාල නොගෙවන ලද සාමාජික මුදල් 2020 වර්ෂය තුළදී ගෙවන ලදී.
- (iii) සාමාජිකයන් 6 දෙනෙකු විසින් 2021 වර්ෂයට අදාල සාමාජික මුදල් 2020 වර්ෂය තුළදී ගෙවන ලදී.
- (iv) 2020 දෙසැම්බර් 31 දින වන විට 2019 සහ 2020 වර්ෂයන්ට අදාල හිඟ සාමාජික මුදල් කිසිවක් නොතිබුණි.
- (v) 2020 වර්ෂය තුළදී නව සාමාජිකයන් **ෆියුචර් ස්ටාර්ස් ක්‍රීඩා සමාජයට** බැඳී නොතිබුණි

(3) 2020 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා ක්‍රීඩා සමාජයේ ලැබීම් සහ ගෙවීම්වල සාරාංශයක් පහත පරිදි වේ:

| | |
|---|---|
| **ලැබීම්:** | |
| පරිත්‍යාග | 720,000 |
| තැන්පතු මත පොලිය | 432,500 |
| සාමාජික දායක මුදල් | ? |
| **ගෙවීම්:** | |
| විදුලිය සහ ක්‍රීඩාංගනයේ නඩත්තු කටයුතු | 397,000 |
| 2020.01.01 දින ක්‍රීඩා උපකරණ මිලදී ගැනීම | 115,000 |
| පුහුණුකරුවන් සඳහා ගෙවීම් | 45,000 |
| මුද්‍රණ සහ ලිපිද්‍රව්‍ය | 50,000 |
| වේතන | 400,000 |
| ප්‍රචාරණය | 25,000 |

(4) පරිත්‍යාග, වර්ෂයට අදාල ආදායමක් ලෙස හඳුනාගත යුතුය.

(5) ක්‍රීඩා උපකරණ වර්ෂ 5 ක ප්‍රයෝජනවත් ආයු කාලයක් තුල ක්ෂය කළ යුතු අතර, 2020 ජනවාරි 01 දිනට පැවති අනෙකුත් දේපළ, පිරියත සහ උපකරණ සම්පූර්ණයෙන්ම ක්ෂය කොට අවසන් වී ඇත.

**ඔබ විසින් කළ යුතු දෑ:**

**ෆියුචර් ස්ටාර්ස් ක්‍රීඩා සමාජයට** අදාලව, 2020 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා පහත සඳහන් දෑ **පිළියෙල කරන්න:**

(a) සාමාජික දායක මුදල් ගිණුම. (ලකුණු 05)

(b) ආදායම් සහ වියදම් ගිණුම. (ලකුණු 05)
(මුළු ලකුණු 10)

## 05 වන ප්‍රශ්නය

(a) **රියානා** හට ඇගේ උපන්දින සාදය **Party 4You** නම් උත්සව කළමනාකරණ සමාගමක් (event management company) මගින් සංවිධානය කර ගැනීමට අවශ්‍යව ඇති අතර, ඔවුන් විසින් එම සාදයට අදාලව පහත සඳහන් තොරතුරු සපයා ඇත:

| | |
|---|---|
| ආහාර ද්‍රව්‍ය සඳහා පිරිවැය | අවම වශයෙන් පුද්ගලයන් 25 දෙනෙකුට යටත්ව පුද්ගලයෙකුට රු.300/- බැගින්. |
| සංගීත කණ්ඩායම, සංගීත භාණ්ඩ සහ සැරසිලි සඳහා පිරිවැය | සාදයක් සඳහා රු.8,500/- බැගින්. |
| ඡායාරූපකරණය | සාදයක් සඳහා රු.10,000/- බැගින්. |
| ශාලා ගාස්තු | සාදයක් සඳහා රු.15,000/- බැගින්. |
| සේවා කාර්ය මණ්ඩලය සැපයීම වෙනුවෙන් වෙන් කිරීම | සේවකයෙකු සඳහා රු.2,500/- බැගින්. |
| වෙනත් පොදුකාර්ය වියදම් වෙන් කිරීම | සාදයක් සඳහා රු.3,950/- බැගින්. |

පුද්ගලයන් 32 ක් සාදය සඳහා සහභාගී වනු ඇතැයි **රියානා** අපේක්ෂා කරනු ලබන අතර, සේවා කාර්ය මණ්ඩල සාමාජිකයින් දෙදෙනෙකුගේ (2) සේවය මේ සඳහා ලබාගැනීමට බලාපොරොත්තු වේ.

**ඔබ විසින් කළ යුතු දෑ:**

**රියානා** විසින් ඇගේ උපන්දින සාදය සඳහා ගෙවීමට සිදුවන මුළු පිරිවැය **ගණනය කරන්න**. (ලකුණු 05)

(b) බේකරි නිෂ්පාදිත නිපදවීමේ යෙදී සිටින **සීමාසහිත බේකර්ස් කුකීස් (පෞද්ගලික) සමාගම,** අසංකලිත ගිණුම්කරණ පද්ධතියක් භාවිත කරයි. පිරිවැය ගිණුම් අනුව 2020 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා පෙන්නුම් කළ ලාභය රු.120,300/- ක් වන අතර, මූල්‍ය ගිණුම් අනුව ලාභය රු.147,900/- ක් විය.

වෙනසට හේතු පහත පරිදි වේ:

(1) තොග අගය කිරීම:

| | **පිරිවැය ගිණුම් අනුව (රු.)** | **මූල්‍ය ගිණුම් අනුව (රු.)** |
|---|---|---|
| ආරම්භක තොගය | 139,450 | 125,500 |
| අවසාන තොගය | 163,400 | 175,200 |

(2) ස්ථාවර තැන්පතු මත ලද රු.35,850/- ක පොලී ආදායම මූල්‍ය ගිණුම්වල පමණක් වාර්තාකර තිබුණි.

(3) උපදේශන ගාස්තු වශයෙන් ගෙවන ලද රු.39,000/- ක් මූල්‍ය ගිණුම්වල සටහන් කොට ඇති අතර, එය පිරිවැය ගිණුම් තුළ සටහන් කර නොතිබුණි.

(4) පිරිවැය ගිණුම් අනුව, පොදුකාර්ය පිරිවැය රු.545,000/- ක් වූ අතර, මූල්‍ය ගිණුම් අනුව එය රු.540,000/- ක් විය.

**ඔබ විසින් කළ යුතු දෑ:**

මූල්‍ය ගිණුම් සහ පිරිවැය ගිණුම් අතර ලාභ සැසඳුම් ප්‍රකාශයක් **පිළියෙල කරන්න**. (ලකුණු 05)

(මුළු ලකුණු 10)

## 06 වන ප්‍රශ්නය

**සීමාසහිත සේෆ් හැන්ඩ්ස් (පෞද්ගලික) සමාගම,** සනීපාරක්ෂක දියර (sanitizer) බෝතල් නිෂ්පාදනය කරන මධ්‍යම ප්‍රමාණයේ ආයතනයක් වන අතර, එහි නිෂ්පාදන දෙපාර්තමේන්තු දෙකක් (2) (නිෂ්පාදන සහ ඇසුරුම්) සහ එක් (1) සේවා දෙපාර්තමේන්තුවක් (තාක්ෂණික) තිබේ.

(1) සමාගම විසින් ඇස්තමේන්තුගත කර ඇති වාර්ෂික නිෂ්පාදන පොදුකාර්ය පිරිවැය රු.7,500,000/- ක් වන අතර, එය පහත පරිදි වේ:

| පිරිවැය අයිතමය | පිරිවැය (රු.) |
|---|---|
| යන්ත්‍ර ක්ෂය | 2,500,000 |
| ගොඩනැගිලි කුලිය | 2,400,000 |
| තත්ත්ව පාලන වියදම් | 800,000 |
| විදුලිය | 1,800,000 |
| **මුළු නිෂ්පාදන පොදුකාර්ය පිරිවැය** | **7,500,000** |

(2) පොදුකාර්ය විභජන පදනම් පහත පරිදි වේ:

| පදනම | නිෂ්පාදන දෙපාර්තමේන්තු | | සේවා දෙපාර්තමේන්තුව | එකතුව |
|---|---|---|---|---|
| | නිෂ්පාදන | ඇසුරුම් | තාක්ෂණික | |
| යන්ත්‍ර පැය | 300,000 | 150,000 | 50,000 | 500,000 |
| භූමි ප්‍රමාණය (වර්ග අඩි) | 1,600 | 500 | 400 | 2,500 |
| විදුලිය භාවිතය (කිලෝ වොට්) | 1,000 | 600 | 200 | 1,800 |
| තත්ත්ව පරීක්ෂණ ගණන | 12 | 8 | - | 20 |
| සෘජු ශ්‍රම පැය ගණන | 100,000 | 200,000 | - | 300,000 |
| පිරිවැය විභජනය - තාක්ෂණික දෙපාර්තමේන්තුව | 60% | 40% | - | 100% |
| බෝතලයක් සඳහා සෘජු ශ්‍රම පැය | 1 | 2 | | |

(3) බෝතලයක් වෙනුවෙන් ඇස්තමේන්තුගත සෘජු පිරිවැය පහත පරිදි වේ:

| බෝතලයක් සඳහා | රු. |
|---|---|
| සෘජු ද්‍රව්‍ය | 20 |
| සෘජු ශ්‍රමය | 15 |
| **ප්‍රාථමික පිරිවැය** | **35** |

**ඔබ විසින් කළ යුතු දෑ:**

(a) එක් එක් දෙපාර්තමේන්තුව සඳහා පොදුකාර්ය පිරිවැය වෙන් කර විභජනය කරනු ලබන්නේ කෙසේදැයි පෙන්වීම සඳහා ප්‍රකාශනයක් **පිළියෙල කරන්න**. (ලකුණු 05)

(b) එක් එක් නිෂ්පාදන දෙපාර්තමේන්තුව සඳහා සෘජු ශ්‍රම පැයක පොදුකාර්ය පිරිවැය අන්තර්ග්‍රහණ අනුපාතය **ගණනය කරන්න**. (ලකුණු 02)

(c) සනීපාරක්ෂක දියර බෝතලයක ඇස්තමේන්තුගත මුළු නිෂ්පාදන පිරිවැය **ගණනය කරන්න**. (ලකුණු 03)

(මුළු ලකුණු 10)

*B කොටසෙහි අවසානය*

## C කොටස

(මුළු ලකුණු 25)

## 07 වන ප්‍රශ්නය

**සීමාසහිත උදාර (පෞද්ගලික) සමාගමේ,** 2020 මාර්තු 31 දිනට ශේෂ පිරික්සුම පහත පරිදි වේ:

*(රු.'000)*

| | හර | බැර |
|---|---|---|
| ප්‍රකාශිත ප්‍රාග්ධනය (සාමාන්‍ය කොටස් 2,000,000) | | 108,000 |
| 2019 අප්‍රේල් 01 දිනට, රඳවාගත් ඉපැයීම් | | 45,600 |
| 2019 අප්‍රේල් 01 දිනට, පොදු සංචිතය | | 20,000 |
| 10% ණයකර | | 20,000 |
| ඉඩම සහ ගොඩනැගිලි - පිරිවැයට (ඉඩම රු. මිලියන 40) | 100,000 | |
| මෝටර් වාහන - පිරිවැයට | 75,000 | |
| පිරියත සහ උපකරණ - පිරිවැයට | 120,000 | |
| 2019 අප්‍රේල් 01 දිනට සමුච්චිත ක්ෂයවීම්: | | |
| ගොඩනැගිලි | | 32,000 |
| මෝටර් වාහන | | 30,000 |
| පිරියත සහ උපකරණ | | 48,000 |
| 2019 අප්‍රේල් 01 දිනට, වෙළෙඳ ලැබිය යුතු මුදල් සඳහා ප්‍රතිපාදනය | | 5,080 |
| 2020 මාර්තු 31 දිනට, තොගය | 54,900 | |
| වෙළෙඳ ලැබිය යුතු මුදල් | 84,300 | |
| අතැති මුදල් සහ බැංකුවේ මුදල් | 15,230 | |
| වෙළෙඳ ගෙවිය යුතු මුදල් | | 8,000 |
| විකුණුම් | | 919,500 |
| විකුණුම් පිරිවැය | 648,300 | |
| ගමන් ගාස්තු සහ ප්‍රවාහන ගාස්තු | 15,400 | |
| ප්‍රචාරණය | 10,600 | |
| විකුණුම් කොමිස් | 7,600 | |
| වැටුප් සහ වේතන | 56,000 | |
| මුද්‍රණ හා ලිපිද්‍රව්‍ය | 2,400 | |
| විදුලිය සහ ජලය | 8,600 | |
| දුරකතන ගාස්තු | 3,800 | |
| බැංකු ගාස්තු | 250 | |
| අළුත්වැඩියා සහ නඩත්තු වියදම් | 2,400 | |
| රක්ෂණ වියදම් | 3,600 | |
| ණයකර පොලී | 1,000 | |
| සාමාන්‍ය කොටස් සඳහා ගෙවූ අතුරු ලාභාංශ | 27,500 | |
| 2019 අප්‍රේල් 01 දිනට ආදායම් බදු වෙන්කිරීම | | 16,000 |
| ගෙවූ ආදායම් බද්ද | 15,300 | |
| | **1,252,180** | **1,252,180** |

පහත සඳහන් අතිරේක තොරතුරු ද සපයා ඇත:

(1) සමාගමේ 2020 මාර්තු 31 දිනට පැවති අවසන් තොගය ගණනය කොට එය පිරිවැයට අගය කරන ලදී. අවසන් තොගය තුළ ඇතුළත් වූ රු.4,900,000/- කට මිලට ගත් තොගයක් යල් පැන ඇති අතර, එම තොගය 2020 අප්‍රේල් මාසයේදී රු.4,200,000/- කට විකිණීමට අපේක්ෂිතය. මේ සම්බන්ධයෙන් කිසිදු ගැලපීමක් ගිණුම් පොත්වල සිදුකර නොතිබුණි.

(2) සමාගම වෙත රු.2,300,000/- ක් අයවිය යුතුව තිබූ ගනුදෙනුකරුවෙක් 2020 අප්‍රේල් 20 දින බුන්වත්යැයි ප්‍රකාශයට පත්කරන ලදී. වෙළෙඳ ලැබිය යුතු මුදල් පිළිබඳ සිදුකළ අවසන් සමාලෝචනයෙන් පසුව, 2020 මාර්තු 31 දිනට පැවති ඉතිරි වෙළෙඳ ලැබිය යුතු මුදල් ශේෂය මත 10% ක ප්‍රතිපාදනයක් පවත්වාගෙන යාමට ද තීරණය කරන ලදී.

(3) 2020 මාර්තු 31 දිනට, පහත සඳහන් උපචිත වියදම් සහ ඉදිරියට කළ වියදම් ගිණුම්ගත කළ යුතුව ඇත:

| | රු. |
|---|---|
| උපචිත විදුලිය | 100,000 |
| ඉදිරියට කළ අළුත්වැඩියා සහ නඩත්තු වියදම් | 200,000 |

(4) දේපළ, පිරියත සහ උපකරණ පිරිවැය මත සරල මාර්ග ක්‍රමයට ක්ෂය කරනු ලබයි. දේපළ, පිරියත සහ උපකරණවල ප්‍රයෝජනවත් ආයු කාලය පහත සඳහන් පරිදි වේ:

| | |
|---|---|
| ගොඩනැගිලි | වර්ෂ 20 |
| මෝටර් වාහන | වර්ෂ 10 |
| පිරියත සහ උපකරණ | වර්ෂ 15 |

(5) 2018/19 තක්සේරු වර්ෂය සඳහා අවසන් ආදායම් බදු වගකීම රු.15,300,000/- ක් වූ අතර, එය ප්‍රවර්තන වර්ෂය තුළදී ගෙවන ලදී. 2019/20 තක්සේරු වර්ෂය සඳහා ඇස්තමේන්තුගත කරන ලද ආදායම් බදු වගකීම රු.11,500,000/- කි.

(6) සමාගම, 2019 අප්‍රේල් 01 දින, නාමික අගය රු.1,000/- බැගින් වූ 10% ණයකර 20,000 ක් නිකුත් කරන ලදී. පොලිය, අර්ධ වර්ෂිකව ගෙවිය යුතු වූ අතර, කාලච්ඡේදය තුළ ගෙවූ පොලිය, ණයකර පොලී ගිණුමට අයකර තිබුණි.

(7) 2020 මාර්තු 31 දින, සමාගමේ අධ්‍යක්ෂ මණ්ඩලය විසින් රඳවාගත් ඉපැයීම්වලින් රු.10,000,000/- ක් පොදු සංචිතයට මාරු කිරීමට තීරණය කරන ලදී.

(8) 2020 මාර්තු 31 න් අවසන් වර්ෂය සඳහා වන මූල්‍ය ප්‍රකාශන නිකුත් කිරීම සඳහා සමාගමේ අධ්‍යක්ෂ මණ්ඩලය විසින් 2020 ජූලි 31 දින අනුමැතිය ලබාදෙන ලදී.

**ඔබ විසින් කළ යුතු දෑ:**

**සීමාසහිත උදාර (පෞද්ගලික) සමාගමේ,** කළමනාකාරිත්වයේ භාවිතය සඳහා, පහත සඳහන් දෑ **පිළියෙල කරන්න**:

(a) 2020 මාර්තු 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා ලාභ'ලාභ සහ වෙනත් විස්තීර්ණ ආදායම් ප්‍රකාශනය (විස්තීර්ණ ආදායම් ප්‍රකාශනය). (ලකුණු 13)

(b) 2020 මාර්තු 31 දිනට මූල්‍ය තත්ත්ව ප්‍රකාශනය. (ලකුණු 12)

(මුළු ලකුණු 25)

*C කොටසෙහි අවසානය*

# කළ යුතු ක්‍රියා පරීක්ෂා ලැයිස්තුව

| නිපුණතා මට්ටම | විස්තරය | ක්‍රියා ලැයිස්තුව | ක්‍රියා නිර්වචනය |
|---|---|---|---|
| දැනුම (1) | තොරතුරු සහ මූලික සංකල්ප ආවර්ජනය කිරීම | අඳින්න | හැඩයක් හෝ රූපසටහනක් ගෙන හැර දැක්වීම. |
| | | සම්බන්ධ කරන්න | තාර්කික හෝ හේතු කාරක සම්බන්ධතාව තහවුරු කිරීම. |
| | | සඳහන් කරන්න | ස්ථිර ලෙස හෝ පැහැදිලිව ප්‍රකාශ කිරීම. |
| | | හඳුනා දක්වන්න | සැලකිලිමත්වීමෙන් පසුව හඳුනා ගැනීම, තහවුරු කිරීම හෝ තෝරා ගැනීම. |
| | | ලැයිස්තුගත කරන්න | විස්තර කිරීමකින් තොරව සම්බන්ධිත අයිතම ලිවීම. |

| නිපුණතා මට්ටම | විස්තරය | ක්‍රියා ලැයිස්තුව | ක්‍රියා නිර්වචනය |
|---|---|---|---|
| අවබෝධය (2) | අදහස් හා තොරතුරු පැහැදිලි කිරීම. | හඳුනාගන්න | අත්දැකීම් හෝ දැනුම භාවිතයෙන් වලංගුබව හෝ වෙනත් ආකාරයෙන් පෙන්වීම. |
| | | අර්ථකතනය කරන්න | වටහාගත හැකි හෝ හුරුපුරුදු පදවලට පරිවර්තනය කරන්න. |
| | | විස්තර කරන්න | ප්‍රධාන ලක්ෂණ ලියා සන්නිවේදනය කරන්න. |
| | | පැහැදිලි කරන්න | අදාල කරුණු භාවිත කර පැහැදිලි විස්තරයක් කිරීම. |
| | | නිර්වචනය කරන්න | ස්වභාවය, විෂය පථය හෝ තේරුම නිශ්චිතව ප්‍රකාශ කිරීම. |

| නිපුණතා මට්ටම | විස්තරය | ක්‍රියා ලැයිස්තුව | ක්‍රියා නිර්වචනය |
|---|---|---|---|
| භාවිතය (3) | අළුත් තත්ත්වයන් තුළ දැනුම භාවිත කර ගැලපීම. | සසඳන්න | තවත් එකක් සමග අනුගත / අනුරූප කරන්න. |
| | | ප්‍රස්තාර දක්වන්න | ප්‍රස්තාර මගින් නියෝජනය කරන්න. |
| | | තක්සේරු කරන්න | වටිනාකම, ස්වභාවය, හැකියාව හෝ ගුණාත්මක බව තීරණය කරන්න. |
| | | විසඳන්න | ගණනය කිරීම හා / හෝ පැහැදිලි කිරීම් හරහා විසඳුම් සෙවීම. |
| | | පිළියෙල කරන්න | විශේෂ අරමුණ සඳහා යමක් කිරීම හෝ සූදානම් වීම. |
| | | ප්‍රදර්ශනය කරන්න | උදාහරණ සමග ඔප්පු කිරීම හෝ ප්‍රදර්ශනය කිරීම. |
| | | ගණනය කරන්න | ගණිතමය ගණනය කිරීම මගින් සොයා දැනගැනීම හෝ ගණන් ගැනීම. |
| | | භාවිත කරන්න | ප්‍රයෝගිකව භාවිතයේ යෙදෙන්න. |

| නිපුණතා මට්ටම | විස්තරය | ක්‍රියා ලැයිස්තුව | ක්‍රියා නිර්වචනය |
|---|---|---|---|
| විශ්ලේෂණය (4) | අදහස් අතර සම්බන්ධතා ගොඩනගා ප්‍රශ්න විසඳීම. | සන්නිවේදනය කරන්න | තොරතුරු බෙදාහදා ගැනීම හෝ හුවමාරු කර ගැනීම. |
| | | සැකිල්ලක් සේ දක්වන්න | සුවිශේෂී ලක්ෂණ සාරාංශ කොට දැක්වීම. |
| | | අසමානතා බලන්න | අසමානතා හෝ වෙනස්කම් සෙවීම පිණිස පරීක්ෂා කිරීම. |
| | | සමානකම් බලන්න | සමානකම් සොයාගැනීම පිණිස පරීක්ෂා කිරීම. |
| | | විමසන්න | තර්ක මගින් සවිස්තර ලෙස පරීක්ෂා කිරීම. |
| | | වෙනස්කොට දක්වන්න | යමක් තවෙකෙකින් වෙනස්කොට දක්වන දැ හඳුනා ගැනීම. |
| | | විශ්ලේෂණය කරන්න | විසඳුම් හෝ ප්‍රතිඵලය තීරණය කිරීම පිණිස විස්තරාත්මකව පරීක්ෂා කරන්න. |